## නියමාවලිය

1. මේ නියමාවලිය 2013 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2013 දෙසැම්බර් මස 02 සිට ක්‍රියාත්මක වන්නේ ය.

2. මෙම නියමාවලිය 2014 ජනවාරි මස 03 වැනි දින අංක 1843/45 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියමයක් මගින් පිහිටුවන ලද (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

3. මේ ආයතනය (මෙහි මින්මතු "විශ්ව විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ වන්නේ ය.

4. ශාස්ත්‍ර පීඨය විසින් වර්තමානයේදී පවත්වනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන්ද ඇතුලුව මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ සෑම පශ්චාත් උපාධි වැඩසටහනක්ම, මේ නියමාවලිය ක්‍රියාත්මක වන දින සිට, ආයතනය විසින් පවත්වා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

5. මේ නියමාවලිය ක්‍රියාත්මක වන දිනයේදී පැවති ආයතනයේ උසස් අධ්‍යාපන උපාධි වැඩසටහන් පාලනය කරනු ලබන රීති සහ නියෝග, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ එකඟත්වය ඇතිව ආයතනය විසින් අන්‍යාකාරයකින් ප්‍රකාශකර ඇත්නම්, වෙනස්කර ඇත්නම් හෝ සංශෝධනය කරනු ලැබ ඇත්නම් මිස, ශාස්ත්‍ර පීඨයේ උසස් අධ්‍යාපන උපාධි පාලනය කරනු ලබන රීති සහ නියෝගවලට සමාන වන්නේ ය.

6. පනතේ විධිවිධානවලට සහ (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ යම් උචිත සාධනපත්‍ර සහ බලතල, කාර්යය සහ කර්තව්‍යවලට යටත්ව, ආයතනයට පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් බලය ඇත්තේය :–

(අ) ශිෂ්‍යයන් ඇතුලත්කර ගැනීම ;

(ආ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි උපදේශන, පුහුණුව සහ පර්යේෂණ සැපයීම ;

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව මානව හා සමාජ විද්‍යාව පිළිබඳ ඇතැම් ක්ෂේත්‍ර වෙත ප්‍රදානය කරනු ලැබිය යුතු පශ්චාත් උපාධි, ඩිප්ලෝමා, සහතිකපත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිළිබඳ තීරණය කිරීම ;

(ඈ) මානව හා සමාජ විද්‍යාව පිළිබඳ අධ්‍යයන පාඨමාලා සඳහා නියම කර ඇති කුසලතා අත්කරගෙන ඇති තැනැත්තන් පිළිබඳ නිශ්චයකර ගැනීමේ කාර්යය සඳහා, විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව විභාග පැවැත්වීම සහ ව්‍යවස්ථාවලින් නියමිත අනෙකුත් කොන්දේසි සපුරා, උපාධි, අභිඥානපත්‍ර, සහතික සහ විශ්වවිද්‍යාලයේ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කරනු ලැබීම සඳහා සුදුස්සන්ව සිටින තැනැත්තන්, විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ඉ) ආයතනයේ අරමුණුවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශීය වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමග ආචාර්යවරයන්, ශිෂ්‍යයන් සහ ශාස්ත්‍රධරයන් හුවමාරුකර ගැනීමෙන් හෝ අන්‍යාකාරව සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(ඊ) ආයතනයට ප්‍රවේශවීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන් විසින් හෝ ආයතනයේ ශිෂ්‍යයන් විසින් විශ්වවිද්‍යාලවලදී සහ විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යයන ආයතනවලදී සමත් විභාග සහ ගත කල අධ්‍යයන කාල සීමාව හෝ හැදෑරූ අධ්‍යයන විෂය, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි පරිදි, ආයතනයේ යම් විභාගවලට සහ ඉගෙනීමේ හෝ අධ්‍යයන කාලසීමාවලට හෝ ඉන් යම් කොටසකට හෝ සමාන බවට පිළිගැනීම සහ ඕනෑම අවස්ථාවක එම පිළිගැනීම ඉවත් කර ගැනීම ;

(උ) ආයතනයේ ඉගැන්වීමේ, පුහුණු කිරීමේ, පර්යේෂණ කිරීමේ සහ පරිපාලනය කාර්ය සඳහා පුස්තකාල, පරිගණක මධ්‍යස්ථාන සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපාංග සැපයීම සහ ඒවා පවත්වාගෙන යෑම ;

(ඌ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි මහාචාර්ය තනතුරු, සහය මහාචාර්ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු, කථිකාචාර්ය තනතුරු සහ වෙනත් තනතුරු ඇතිකිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම සඳහා විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(එ) විශ්වවිද්‍යාලය විමසා ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව, ජාත්‍යදක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, දීමනා, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇතිකිරීම සහ ප්‍රදානය කිරීම ;

(ඒ) පර්යේෂණ සහ අධ්‍යයන පාඨමාලා හෝ අධ්‍යයන පාඨමාලාවලින් කොටසක් ආයතනයෙන් බාහිරව පැවැත්වීම සඳහා විධිවිධාන යෙදිය යුතු යයි නියම කෙරෙන යම් අතුරු ව්‍යවස්ථාවකට අනුකූලව පර්යේෂණ, අධ්‍යයන පාඨමාලා හෝ පාඨමාලාවලින් කොටසක් හෝ ආයතනයෙන් බාහිරව පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීම ;

(ඔ) ආයතනය විසින් පිළිගනු ලබන තැනැත්තන් විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව එහි ගුරුවරුන් සහ විභාග පරීක්ෂකවරුන් වශයෙන් පිළිගැනීම ;

(ඕ) ගාස්තු ගෙවීම නියම කෙරෙන යම් රීතියකට අනුකූලව ගාස්තු ඉල්ලා සිටීම සහ ලබාගැනීම ; සහ

(ක) ආයතනයේ පරමාර්ථ ඉටුකර ගැනීම පිණිස ඉහතකී බලතල, කාර්ය සහ කර්තව්‍යවලට ආනුෂංගික හෝ ඒ හේතුවෙන් අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා බාරගැනීම,

සඳහා බලය ඇත්තේ ය.

7. ආයතනයට පහත සඳහන් නිලධරයන් සිටිය යුතු ය :–

(i) අධ්‍යක්ෂවරයා ; සහ

(ii) වෙනත් යම් තනතුරක් දරන තැනැත්තකු මේ ඡේදයෙහි කාර්යයන් සඳහා නිලධරයකු බව නියමාවලිය මගින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේද, එකී තනතුරක් දරනු ලබන තැනැත්තා.

8. (1) ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාලයේ නිර්දේශ මත විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් අතරින් කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය.

(2) පසුව පත්වන සෑම අධ්‍යක්ෂවරයකුම, ආයතනයේ කළමනාකාර මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ එම තනතුරෙහි ස්ථිර කරනු ලැබ ඇති ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් යුත් මූල මණ්ඩලයකින් කොමිෂන් සභාව විසින්, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව පත් කරනු ලැබිය යුතු ය.

(3) උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු අධ්‍යක්ෂ වශයෙන් පත්කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ එසේ පත්කරනු ලැබූ සාමාජිකයා, අධ්‍යක්ෂ තනතුර බාරගැනීම සඳහා, ඒ ආයතනය විසින් මුදා හැරිය යුතු ය. අධ්‍යක්ෂ ධූරය බාරගැනීම සඳහා පසුව නම්කරනු ලබන සෑම ආචාර්වයරයකුම, විශ්වවිද්‍යාලය විසින් මුදා හරිනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයකු කලින් ධූරය අත්හැර ගියහොත් මිස හෝ (5) වන අනුඡේදය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත්කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයක් ගතවීම හෝ ඔහුට හැටපස්වන විය සම්පූර්ණවීම හෝ මේ අවස්ථාවලින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ධූරය දරන්නේ ය.

(5) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කරගැනීම සඳහා කැඳවනු ලැබූ කළමනාකාර මණ්ඩලයේ (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශේෂ රැස්වීමකදී එම මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් මත කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හේතු දක්වා අධ්‍යක්ෂවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය. ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතරින්, අධ්‍යක්ෂවරයා හැර වෙනත් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කර ගත යුතු ය.

(6) ධූරයෙන් ඉවත් කරන ලද හෝ ධූරයෙන් ඉල්ලා අස්වන අධ්‍යක්ෂවරයකු, අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරනු ලැබීමට ඉහතින්ම උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු කලින් දැරූ තනතුරින් විශ්‍රාම ගැනීමේ වයසට එළඹ නොමැති නම්, එකී උසස් අධ්‍යාපන ආයතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහු පෙරළා පැමිණිය යුතු ය.

(7) නිවාඩු පිට සිටීම, රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනයම් හේතුවක් නිසා තම ධූරයේ කාර්ය ඉටුකිරීමට අධ්‍යක්ෂවරයාට තාවකාලිකව නොහැකි වූවහොත්, එසේ කාර්ය ඉටු කිරීමට නොහැකිවීමෙන් දින හතක් ඇතුළත, ඒ ධූරයේ කාර්ය ඉටුකිරීම සඳහා සුදුසුයැයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙලක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය. එසේ වැඩපිළිවෙලක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිරවයා විසින් ඒ ධූරයේ එදිනෙදා කාර්ය කරගෙන යා යුතු ය.

(8) අධ්‍යක්ෂ ධූරයේ යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත්, ඒ පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත, (2) වන අනුඡේදය යටතේ ස්ථිර පත්වීමක් කරනු ලබනතුරු ඒ ධූරයේ කටයුතු කරගෙන යාමට සුදුසුයයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙලක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය. එසේ වැඩපිළිවෙලක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා විසින් ඒ ධූරයේ එදිනෙදා කාර්ය කරගෙන යා යුතු ය.

9. (1) අධ්‍යක්ෂවරයා ආයතනයේ පූර්ණකාල නිලධරයකුවන අතර ඔහු එහි ප්‍රධාන විධායක නිලධරයා සහ ශාස්ත්‍රීය නිලධරයා මෙන්ම එහි ගණන් දීමේ නිලධරයාද වන්නේ ය.

(2) අධ්‍යක්ෂවරයා නිලබලයෙන් මණ්ඩලයේ සාමාජිකයකුද, ආයතනයේ එක් එක් අධ්‍යයන මණ්ඩලවල නිලබලයෙන් පත් වූ සාමාජිකයකු ද වන්නේය. මණ්ඩලයේ හෝ වෙනත් යම් බලමණ්ඩලයක හෝ පුද්ගල මණ්ඩලයක යම් රැස්වීමකට පැමිණ සහභාගිවීමට අධ්‍යක්ෂවරයාට හිමිකම් ඇති නමුත් ඔහු එම වෙනත් බලමණ්ඩලයේ හෝ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ නම් මිස, ඒ යම් රැස්වීමකදී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොමැති විය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමකට අධ්‍යක්ෂවරයා පැමිණ නොසිටින අවස්ථාවකදී, එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගෙන් එක් අයකු සාමාජිකයන් විසින් තෝරා පත්කරගනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා නීත්‍යානුකූලව වරින් වර තමාවෙත නිකුත්කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව, නියමාවලියේ, පනතේ හෝ වෙනත් යම් උචිත සාධනපත්‍රයක විධිවිධාන ආයතනයට අදාලවන තාක් දුරට ඒ විධිවිධාන යථා පරිදි පිළිපදින බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේය. තවද, ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහුට ඇති අතර ඒ බලතල ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ සහ සෑම එක් එක් අධ්‍යයන මණ්ඩලයකම තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීමට සහතික වීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුතු ය.

(5) ආයතනය තුළ විනය, නීතිය සහ යහපැවැත්ම පවත්වාගෙන යෑම පිළිබඳව අධ්‍යක්ෂවරයා වගකිව යුතු ය.

10. ආයතනය පහත සඳහන් අංශවලින් සමන්විත විය යුතු ය.

(අ) මණ්ඩලය ;

(ආ) අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩලය ; සහ

(ඇ) එහි අධිකාරීන් ලෙස සලකනු ලැබිය යුතු නියමාවලිය මගින් නියම කරනු ලබන වෙනත් මණ්ඩල.

11. මණ්ඩලය, ආයතනයේ ශාස්ත්‍රීය හා විධායක මණ්ඩලය වන අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :–

(1) නිලබලයෙන් පත්වන සාමාජිකයන් එනම් –

(i) මණ්ඩලයේ සභාපති විය යුතු ආයතනයේ අධ්‍යක්ෂවරයා ;

(ii) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා ;

(iii) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ;

(iv) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, කෘෂිවිද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ;

(v) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ (පර්යේෂණ) ;

(vi) උසස් අධ්‍යාපන විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කළ තැනැත්තකු ;

(vii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කළ තැනැත්තකු ;

(viii) මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කළ තැනැත්තෙකු ;

(ix) විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ සෑම අංශයකම අංශාධිපතිවරු ; සහ

(x) සෑම අධ්‍යයන මණ්ඩලයකම සභාපතිවරයා.

(2) පහත දැක්වෙන වෙනත් සාමාජිකයන්, එනම් -

(i) කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන එක් සාමාජිකයකු ; සහ

(ii) මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ විශිෂ්ඨ සේවයක් ඉටු කළ තැනැත්තන් අතරින් මණ්ඩලය විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු.

12. (1) කලින් ධූරය අත්හැරියහොත් මිස, යම් තෝරා පත්කරගනු ලැබූ හෝ පත්කල සාමාජිකයකු ඔහු එසේ තෝරා පත්කරගනු ලැබූ හෝ පත්කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ධූරය දැරිය යුතු අතර, ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස ඔහු නැවත තෝරාපත් කර ගනු ලැබීමට හෝ නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(2) (අ) යම් තෝරා පත්කරගනු ලැබූ හෝ පත්කරනු ලැබූ සාමාජිකයකු ඔහුගේ ධූරකාලය ඉකුත්වීමට ප්‍රථම ධූරය අත්හැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, ඔහුද ධූරය කලින් අත්හැර ගියහොත් මිස, ඔහුගේ පූර්වගාමියාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධූරය දැරිය යුතු ය

(ආ) තෝරා පත්කරගනු ලැබූ සාමාජිකයා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබුවේ යම් තරාතිරමක් ප්‍රකාරවද, එය දරන තාක් කල් ඔහු මණ්ඩලයේ සාමාජික ධූරය දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ තෝරා පත්කරගනු ලැබූ සාමාජිකයකු විසින් අධ්‍යක්ෂවරයා අමතා යවන ලිඛිත ඉල්ලීමක් මගින් සාමාජික ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) මණ්ඩලයේ යම් පත්කළ හෝ තෝරා පත්කරගනු ලැබූ සාමාජිකයකු අවසර නොලබා මණ්ඩලයේ යම් අනුක්‍රමික රැස්වීම් තුනකට පැමිණීම පැහැර හැරියහොත්, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධූරය අත්හැරියා සේ සැලකිය යුතු අතර, එම පුරප්පාඩුව සඳහා සුදුසු තැනැත්තකු කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(6) අවශ්‍යවන කවර අවස්ථාවක වුවද, මණ්ඩලය රැස්විය යුතු ය. එසේ වුවද, එක් වර්ෂයක් තුළ මණ්ඩලය හය වාරයකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු ය.

(7) මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක දී නැතහොත් මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවක් විසින් ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ ඉල්ලීමක් අධ්‍යක්ෂවරයා වෙත ලැබී සතියක් ඇතුළත හෝ මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

13. (1) පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හෝ කිරීම කරනු ලැබිය යුතු ය :–

(අ) ආයතනයේ චංචල සහ නිශ්චල දේපළ මෙන්ම අරමුදල් දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ;

(ආ) පනතේ සහ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනය හා සම්බන්ධ කාරණා තීරණය කිරීම සහ විධිමත් කිරීම ;

(ඇ) ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සහ කළමණාකරනය සඳහා සහ වෙනත් නිශ්චිත කාර්ය සඳහා වූ ආයතනයේ අරමුදල් පරිපාලනය සහ පාලනය කිරීම ;

(ඈ) ආයතනයට අන්තිම කැමති පත්‍ර මගින්, පරිත්‍යාග මගින් සහ වෙනත් ප්‍රදාන වශයෙන් ලැබෙන චංචල හෝ නිශ්චල දේපළ, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පිළිගැනීම සහ භාර ගැනීම ;

(ඉ) ආයතනයේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද ගිණුම් සලකා බැලීම සහ එම වාර්තාව සහ ගිණුම් විශ්ව විද්‍යාලයට සහ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම ;

(ඊ) අධ්‍යයන මණ්ඩලය සහ අධ්‍යයන මණ්ඩල විමසා, සියලුම මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා විෂයයන් සඳහා ප්‍රදානය කරනු ලැබිය යුතු පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතිකපත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා නිර්දේශ කිරීම සහ එම උපාධි සහ අභිඥානපත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා සුදුසුකම් ලැබීම පිණිස ශිෂ්‍යයන් අනුගමනය කළ යුතු අධ්‍යයන පාඨමාලා සහ පුහුණු පාඨමාලා ද සමත් විය යුතු විභාග සහ සපුරාලිය යුතු අනෙකුත් කොන්දේසි නිර්දේශ කිරීම ;

(උ) අතුරු ව්‍යවස්ථා හෝ රීති සෑදීමට බලය පැවරී ඇති කවර හෝ කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා සහ රීති සෑදීම සහ අවස්ථාවෝචිත පරිදි, ඒ අතුරු ව්‍යවස්ථා හෝ රීති පාලක සභාව හෝ සනාතන සභාව වෙත ඉදිරිපත් කිරීම ;

එසේ වුවද, අවස්ථාවෝචිත පරිදි, අධ්‍යයන මණ්ඩලයේ හෝ මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් පසුව හැර, අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධ අතුරු ව්‍යවස්ථා හෝ රීති කිසිවක් සාදනු නොලැබිය යුතු ය ;

(ඌ) ආයතනයේ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍යවන ගොඩනැගිලි, පරිශ්‍ර, ලී බඩු උපකරණ සහ අනෙකුත් ද්‍රව්‍ය සැපයීම ;

(එ) විශ්වවිද්‍යාලය විමසා -

(i) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍යවිය හැකි පරිදි වූ ආචාර්ය සහ පරිපාලන තනතුරු ඇතුලු තනතුරු ඇතිකිරීම සඳහා සහ ඒ තනතුරු අවලංගු කිරීම හෝ අත්හිටුවීම සඳහා

(ii) ආයතනයට පත්කර ගැනීම සඳහා ආචාර්යවරුන්ට, නිලධරයන්ට සහ අනෙකුත් සේවා නියුක්තයන්ට තිබිය යුතු වන්නා වූ සුදුසුකම් ;

(iii) ආයතනයේ ආචාර්යවරුන් සහ පරීක්ෂකවරුන් ලෙස පත්කර ගැනීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තන්,

කොමිෂන් සභාවට නිර්දේශ කිරීම ;

(ඒ) ආයතනයේ සේවානියුක්තිකයන් සහ ශිෂ්‍යයන් සම්බන්ධයෙන් අත්හිටුවීමේ, තහනම් කිරීමේ හෝ වෙනත් ආකාරයේ විනයානුකූල පියවර ගැනීම් පිළිබඳව විශ්වවිද්‍යාලය වෙත නිර්දේශ කිරීම ;

(ඔ) විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලැබූ අදාළ අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩලවල වාර්තා ලබා ගැනීමෙන් පසුව,

(අ) ආයතනයේ පවත්නා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ ආයතනයේ අලුත් මණ්ඩල සංවිධානය සඳහා වූ යෝජනා ක්‍රම ; සහ

(ආ) අදාළ අධ්‍යයන මණ්ඩලය වෙත මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා විෂයයන් පැවරීම,

පිළිබඳව කොමිෂන් සභාව වෙත නිර්දේශ කිරීම ;

(ඕ) මණ්ඩලයට සුදුසුයයි පෙනී යන ප්‍රමාණයක ස්ථාවර කමිටු හෝ තත්කාර්ය කමිටු පත්කිරීම හා ඒවායේ විෂය කරුණු නියම කිරීම සහ එම කමිටුවල වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් සහිතව හෝ රහිතව ඒ වාර්තා අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම ;

(ක) පාඨමාලා සඳහා ශිෂ්‍යයන් තෝරා ගැනීමේ හා ඇතුළත් කිරීමේ උපමාන, අධ්‍යයන මණ්ඩලය හෝ මණ්ඩල විමසා සහ විශ්ව විද්‍යාලයේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාවට නිර්දේශ කිරීම

(ග) නොයොදවා ඇති යම් ආදායමක්ද ඇතුළුව, ආයතනයට අයත් යම් මුදලක් භාර ආඥාපනතේ 20 වැනි වගන්තියේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ භාරමුදල් ආයෝජනය කිරීම නීත්‍යානුකූල වන්නා වූ යම් සුරැකුම්පතක ආයෝජනය කිරීම නැතහොත් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිලට ගැනීම සඳහා එවැනි මුදලක් ආයෝජනය කිරීම, හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වියදම සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයක්, කොමිෂන් සභාව අනුමත කරන යම් බැංකුවක ස්ථාවර තැන්පතුවක් ලෙස තැන්පත් කිරීම ;

(ච) මේ නියමාවලිය මගින් හෝ වෙනත් උචිත සාධනපත්‍රයක විධිවිධාන සලසා ඇති පරිදි ආයතනයේ බලතලවල ප්‍රතිඵලයක් වන හෝ ඒ බලතලවලට ආනුෂංගික වන ආයතනයේ වෙනත් සියලු බලතල ක්‍රියාවේ යෙදවීම.

(2) යම් ශාස්ත්‍රීය කාරණයක් පිළිබඳ කිසිදු යෝජනා සම්මතයක්, ඒ පිළිබඳව ස්වකීය මතය වාර්තාගත කිරීමට සහ එම මතය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අධ්‍යයන මණ්ඩලයට හෝ අධ්‍යයන මණ්ඩලවලට ප්‍රථමයෙන් අවස්ථාවක් ලබාදීමෙන් පසුව මිස, මණ්ඩලය විසින් එවැනි යෝජනා සම්මතයක් සම්මත නොකළ යුතු ය ;

එසේ වුවද, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව මිස, එසේ අනුමත කරන යෝජනා සම්මතයක් පරිදි ක්‍රියා නොකළ යුතු ය.

මේ ඡේදයේ "ශාස්ත්‍රීය කාරණය" යන්නෙන් අධ්‍යයන මණ්ඩලයක හෝ මණ්ඩලවල පාලනයට සහ සාමාන්‍ය විධානයට යටත් කවර හෝ කාරණයක් අදහස් වේ.

14. මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ පහත දැක්වෙන සෑම විෂයය කාණ්ඩ සඳහා සහ එම ක්ෂේත්‍රයේම වෙනත් විෂයයන් සඳහා ආයතනය විසින් අධ්‍යයන මණ්ඩල ඇතිකරනු ලැබිය යුතු ය :–

(1) සමාජ විද්‍යාව සඳහා වූ අධ්‍යයන මණ්ඩලය.

භූගෝල විද්‍යාව
සමාජ විද්‍යාව
දේශපාලන විද්‍යාව
ඉතිහාසය
පුරාවිද්‍යාව
ජාත්‍යන්තර සම්බන්ධතා
නීතිය

(2) භාෂා සහ සාහිත්‍ය අධ්‍යයනය සඳහා වූ අධ්‍යයන මණ්ඩලය.

සිංහල
දෙමළ
අරාබි
ඉංග්‍රීසි

(3) ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය සඳහා වූ අධ්‍යයන මණ්ඩලය.

කළමනාකරණය
ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
සංඛ්‍යානය

(4) මනෝවිද්‍යාව, දර්ශන විද්‍යාව සහ අධ්‍යාපනය සඳහා වූ අධ්‍යයන මණ්ඩලය.

මනෝ විද්‍යාව
දර්ශන විද්‍යාව
අධ්‍යාපනය

(5) ආගමික සහ සංස්කෘතික අධ්‍යාපනය සඳහා වූ අධ්‍යයන මණ්ඩලය.

පාලි
සංස්කෘත
බටහිර සම්භාව්‍ය සාහිත්‍ය
බෞද්ධ අධ්‍යයනය
ලලිතකලා
සංසන්දනාත්මක ආගම
ඉස්ලාම් ශිෂ්ටාචාරය
හින්දු ශිෂ්ටාචාරය

15. (1) සෑම අධ්‍යයන මණ්ඩලයක්ම පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :–

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයකු වන අධ්‍යක්ෂවරයා ;

(ආ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ අදාළ අධ්‍යයන අංශයේ ප්‍රධානියා ;

(ඇ) විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය විසින් නම් කරනු ලබන එම විශ්වවිද්‍යාලයේ අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලැබ ඇති ආචාර්යවරුන් අතරින් පත්කර ගනු ලබන සාමාජිකයන් සිව්දෙනෙකු

(ඈ) මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා විෂයයන් සම්බන්ධයෙන් විශිෂ්ඨත්වයක් ලබා ඇති තැනැත්තන් අතරින් මණ්ඩලය විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු.

(2) යම් අධ්‍යයන මණ්ඩලයක් විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, නිශ්චිත කාර්යයක් සඳහා සහ නිශ්චිත කාලසීමාවක් සඳහා තැනැත්තන් එක් කෙනෙකු වැඩිපුර එක් කරගත හැකි නමුත් එසේ වැඩිපුර එක්කර ගන්නා ලද තැනැත්තකුට එවැනි අධ්‍යයන මණ්ඩලයක ඡන්ද විමසීමකදී, ඉදිරිපත්වීමට හෝ යම් රැස්වීමකදී ඡන්දය දීමට අයිතියක් නොමැත්තේ ය.

(3) සෑම අධ්‍යයන මණ්ඩලයක් සඳහාම ස්වකීය සාමාජිකයන් අතරින් අධ්‍යයන මණ්ඩලය විසින් තෝරා පත්කරනු ලැබිය යුතු සභාපතිවරයකු විය යුත්තේ ය.

(4) සෑම අධ්‍යයන මණ්ඩලයක් සඳහාම ස්වකීය සාමාජිකයන් අතරින් අධ්‍යයන මණ්ඩලය විසින් තෝරා පත්කරගනු ලැබිය යුතු ලේකම්වරයකු සිටිය යුත්තේ ය.

(5) අධ්‍යයන මණ්ඩලයක රැස්වීමක් සඳහා වූ ගණපූරණය වැඩිපුර එක්කර ගන්නා ලද සාමාජිකයන් ඇතොත් ඔවුන්ද සමග සාමාජිකයන් සිව්දෙනෙකු විය යුතු ය.

(6) සෑම අධ්‍යයන මණ්ඩලයක්ම අවශ්‍ය කවර හෝ අවස්ථාවක රැස්විය යුතු අතර එක් එක් වර්ෂයකදී හය වතාවකට නොඅඩු වාර ගණනක් වන සේ රැස්විය යුතු ය.

16. (1) පනතේ විධිවිධානවලට සහ යම් උචිත සාධනපත්‍රයක විධිවිධානවලට යටත්ව, සෑම මණ්ඩලයක් සඳහාම මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාවට අදාළ විෂයයන් ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ සහ විභාග පිළිබඳ පාලනයක් සහ පොදු විධානයක් තිබිය යුත්තේ ය.

(2) (1) වන අනුඡේදය මගින් තමා වෙත පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, එක් එක් අධ්‍යයන මණ්ඩලයක් විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම, කිරීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුත්තේ ය :–

(අ) මණ්ඩලය විසින් යොමුකරන ලද යම් කාරණයක් සලකා බලා ඒ පිළිබඳ වාර්තා කිරීම ;

(ආ) මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා විෂයයන් පිළිබඳ අධ්‍යයන පාඨමාලා ඉගැන්වීමේ වැඩසටහන් හෝ පුහුණු කිරීමේ වැඩසටහන් සහ විභාගවලට අදාළ සියලු කරුණු සම්බන්ධව මණ්ඩලය වෙත නිර්දේශ හා වාර්තා ඉදිරිපත් කිරීම ;

(ඇ) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් පිළිබඳ සලකා බලා වාර්තා කිරීමේ කාර්යය සඳහා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් නොවන තැනැත්තන්ද ඇතුලත් විය හැකි කමිටු පත් කළ යුතු ය ;

(ඈ) මණ්ඩලය වෙත අධ්‍යයන පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කිරීම සහ විභාග සඳහා නියමයන් නිර්දේශ කිරීම ;

(ඉ) මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා විෂයයන් පිළිබඳ අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට අදාළ නියෝග කෙටුම්පත් කිරීම සහ එම කෙටුම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ;

(ඊ) ආචාර්යවරයන් සහ පරීක්ෂකවරයන් ලෙස පිළිගැනීමට යෝග්‍ය තැනැත්තන් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(උ) මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා නියමිත විෂයයන් සමත්වී ඇති සහ අනෙකුත් නියමිත කොන්දේසි සම්පූර්ණ කර ඇති, එම විෂයයන්ට අදාළව පශ්චාත් උපාධි, අභිඥානපත්‍ර, සහතිකපත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරිනැමිය යුතු තැනැත්තන් මණ්ඩල වෙත නිර්දේශ කිරීම ;

(ඌ) අධි ශිෂ්‍යත්ව, ජාත්‍යදක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, දීමනා, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා තරග කෙරෙන ආකාරය සහ ඊට අදාළ කොන්දේසි මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(එ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍යදක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, දීමනා, පදක්කම් සහ වෙනත් ත්‍යාග පිරිනැමීමට සුදුසු තැනැත්තන්ගේ නම් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ; සහ

(ඒ) (i) පවත්නා අධ්‍යයන මණ්ඩලය ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ අලුත් අධ්‍යයන මණ්ඩල සංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම ; සහ

(ii) අදාළ අධ්‍යයන මණ්ඩල වෙත මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා විෂයයන් පැවරීම පිළිබඳව.

මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

17. ලිත් වර්ෂය ආයතනයේ මුදල් වර්ෂය විය යුතු ය.

18. (1) ආයතනයෙහි (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් තිබිය යුතු අතර එම අරමුදලට පහත දැක්වෙන මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(අ) යම් උචිත සාධාන පත්‍රයකට විධිවිධානවලට අනුකූලව ආයතනයට ගෙවිය යුතු සියලු ගාස්තු ;

(ආ) පරිත්‍යාගවලින් අත්වන සියලු ආදායම් ;

(ඇ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ කොමිෂන් සභාව විසින් ප්‍රදාන වශයෙන් බෙදා දෙන සියලු මුදල් ; සහ

(ඈ) කවර වූ හෝ ප්‍රභවයකින් ආයතනයට උපචිත වන ආයතනයේ වෙනත් සියලු මුදල්.

(2) කිසියම් මාසයක් තුළදී අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් පිළිබඳ සාරාංශයක්, අදාළ ආදායම් ශීර්ෂ යටතේ වර්ග කර, ඊළඟට එළඹෙන මාසය අවසාන වීමට පෙර අධ්‍යක්ෂවරයා විසින්, කොමිෂන් සභාවේ දැන ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

19. (අ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පිළිවෙලකට සහ ආකාරයකට ආයතනයේ ගිණුම් තබා ගැනීම ;

(ආ) අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් බාර ගැනීම සහ එම මුදල් නිසි ගිණුම් ශීර්ෂවලට බැරකිරීම ;

(ඇ) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම ; සහ

(ඈ) මණ්ඩලය සඳහා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ එළැඹෙන වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය විසර්ජන පිළියෙල කිරීම,

අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය :

එසේ වුවද, නිශ්චිත කාර්ය සඳහා කරන ලද ප්‍රදානවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා කරන ලද පරිත්‍යාගවලින් ලැබෙන ආදායම ආයතනයේ ගිණුම්වල වෙන වෙනම ගිණුම් ගත කළ යුතු අතර, ආයතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ ඒ ප්‍රදාන හෝ පරිත්‍යාග කරන ලද්දේ පිළිවෙලින් යම් කාර්ය හෝ අරමුණු සඳහා ද ඒවා නොවන කාර්ය හෝ අරමුණු සඳහා හෝ ඒ ආදායමෙන් කිසි ගෙවීමක් නොකළ යුතු ය.

20. (1) කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන පිළිවෙලකට හා ආකාරයකට හා එසේ නියම කරනු ලබන විස්තර ද ඇතුළත්කොට ආයතනයේ කටයුතුවලට අදාළ වාර්ෂික ගිණුම් හා සංඛ්‍යා ලේඛන පිළිබඳ ප්‍රකාශයක් ආයතනය විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතනයේ කාර්යාලයේ තැබිය යුතු ය.

21. උසස් අධ්‍යාපන ආයතනයක ගිණුම් විගණනයට අදාළව පනතේ xiii වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ ගිණුම් විගණනය කෙරෙහි හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

22. (1) ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන් කාර්යක්ෂම ලෙස ඉටුකිරීම කිරීම, කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව පත්කරන ලද නිලධරයන් හෝ ආචාර්යවරයන්ගෙන් සහ සේවා නියුක්තිකයන්ගෙන්, ආයතනයේ කාර්ය මණ්ඩලය සමන්විත විය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, ආයතනයේ කාර්ය මණ්ඩලය, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය අතරින් විශ්වවිද්‍යාලය විසින් මුදවා හැරීමෙන් සැපයිය යුතුය. නැතහොත් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. පනතේ X වන කොටසේ විධිවිධාන, ආයතනයේ කාර්ය මණ්ඩලයේ පත්කිරීම් සම්බන්ධව අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවා නියුක්තිකයකු ආයතනයේ සේවය සඳහා පූර්ණකාලීන පදනම මත මුදා හැර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරෙහි ඔහු ලැබූ වැටුප සහ දීමනා ඔහුට ගෙවනු ලැබිය යුතු ය. එසේ නොවන අවස්ථාවකදී, විශ්වවිද්‍යාලය විමසා, ආයතනය විසින් නිශ්චය කරන, කොමිෂන් සභාව අනුමත කරන පරිදි වූ දීමනාවක් එම නිලධරයාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවා නියුක්තිකයාට ආයතනය විසින් ගෙවනු ලැබිය යුතු ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් අධ්‍යක්ෂවරයාගේ විධානයට සහ විනය පාලනයට යටත් විය යුතු ය. විශ්වවිද්‍යාලයේ පාලක සභාව ආයතනයේ විනය අධිකාරිය වන්නේ ය.

23. ආයතනයේ යම් මණ්ඩලයකට හෝ වෙනත් බල මණ්ඩලයකට යම් තැනැත්තකු යථා පරිදි තෝරා පත් කරනු ලැබී ද, පත් කරනු ලැබී ද, නම් කරනු ලැබී ද, අතිරේකව යොදවා ගනු ලැබී ද, නැතහොත් ඔහු ඒ බල මණ්ඩලයේ හෝ වෙනත් මණ්ඩලයක සාමාජිකයකුව සිටීමට හිමිකම් ලබා තිබේද යන්න ගැන යම් ප්‍රශ්නයක් පැන නැඟුනහොත් ඒ ප්‍රශ්නය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර ඒ පිළිබඳ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

24. ආයතනයේ සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ ඒ සාමාජිකයන් පත්කිරීමෙහිලා යම් දෝෂයක් හෝ දෝෂ තිබීමේ හේතුවෙන්ම පමණක් ආයතනයේ යම් ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ නීති කෘත්‍යයක් නිර්බල නොවිය යුතු ය.

25. මේ නියමාවලියේ -

"ශාස්ත්‍ර පීඨය" යන්නෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය අදහස් වේ ;

"පනත" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ ; සහ

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙන් පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන විශ්වවිද්‍යාලයක්, මණ්ඩපයක්, විවෘත විශ්වවිද්‍යාලයක් හෝ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක් හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් අදහස් වේ.

01 - 513

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 – PG 1900